**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ**

# [කෙටුම්පත්] මානව හිමිකම් ආරක්ෂකයින් ආරක්ෂා කිරීම පිළිබඳ පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ

2023 දෙසැම්බර් 11

**හැඳින්වීම**

1998 දෙසැම්බර් 9 වන දින, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මානව හිමිකම් සහ මූලික නිදහස ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා සමාජයේ පුද්ගලයන්, කණ්ඩායම් සහ සංවිධානවල අයිතිය සහ වගකීම පිළිබඳ ප්‍රකාශය සම්මත කරන ලදී. (මානව හිමිකම් ආරක්ෂකයින් පිළිබඳ ප්‍රකාශනය).

මෙම ප්‍රකාශයේ 1 වන වගන්තිය: 'ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් මානව හිමිකම් සහ මූලික නිදහස ආරක්ෂා කිරීමට, සාක්ෂාත් කර ගැනීම හා ප්‍රවර්ධනය කිරීමට සහ ඒ සඳහා උත්සාහ කිරීමට සෑම කෙනෙකුටම අයිතිය ඇත'.

මානව හිමිකම් ආරක්ෂකයින් යනු තනි තනිව හෝ වෙනත් අය සමඟ එක්ව මානව හිමිකම් සාමකාමීව ප්‍රවර්ධනය කිරීමට හෝ ආරක්ෂා කිරීමට ක්‍රියා කරන පුද්ගලයන් ලෙසයි. ඔවුන් කාන්තාවන්, ළමුන්, වාර්ගික සහ ආගමික සුළුතරය කණ්ඩායම්, ආබාධ සහිත පුද්ගලයින්, අභ්‍යන්තරව අවතැන් වූවන්, සංක්‍රමණික සේවකයින් සහ LGBTIQ+ ප්‍රජාව ඇතුළුව ආන්තික සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල අයිතිවාසිකම් ඇතුළු මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින ප්‍රධාන නියෝජිතයන් වේ. ඔවුන් ක්‍රියා කරන්නේ ඔවුන්ගේ පෞද්ගලික මට්ටමෙන් හෝ මානව හිමිකම් සම්බන්ධයෙන් සැලකිලිමත් වන සිවිල් සමාජ කණ්ඩායම්වල සහ රාජ්‍ය නොවන සංවිධානවල (NGO) කොටසක් ලෙස ය.

ප්‍රජාවන් අතර දුක්ගැනවිලි හේතුවෙන් සහ වාර්ගික සහ ආගමික කණ්ඩායම් අතර වගා කරන ලද එදිරිවාදිකම් හේතුවෙන් ශ්‍රී ලංකාව ප්‍රචණ්ඩ ගැටුම් සහිත කාල පරිච්ඡේද අත්විඳ ඇත. ප්‍රචණ්ඩ ගැටුම් අතරතුර සහ ඉන් පසුව, ශ්‍රී ලංකාව නීතියට පිටින් සිදුවන ඝාතන, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්, වධහිංසා පැමිණවීම්, අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් සහ අවතැන්වීම් ඇතුළු බරපතල මානව හිමිකම් කඩකිරීම් දුටුවේය. එවැනි උල්ලංඝනවල ප්‍රතිවිපාක අදටත් අත්විඳිමින් සිටී. මේ අතර, විවිධ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සුළුතර කණ්ඩායම් වෙනස් කොට සැලකීමට හා හිරිහැරවලට ලක්ව ඇත. ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ සලකා බැලුවේ මෑතක දී ය. ඒ හා සමානව, ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා නීති සම්පාදනය කිරීමට බොහෝ කලක් ගත වී ඇත. ශ්‍රී ලංකාව ද ආර්ථික අර්බුදයකට මුහුණ දී ඇති අතර එමඟින් ආර්ථික ආන්තික කන්ඩායම් ඔවුන්ගේ සමාජ ආර්ථික අයිතීන් ඇතුළු අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් වලට ගොදුරු වේ. මෙම අතිවිශාල සන්දර්භය තුළ, මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීම, උල්ලංඝනය කිරීම් ලේඛනගත කිරීම, අයිතිවාසිකම් උල්ලංඝනය කරන නීති සහ ප්‍රතිපත්තිවලට අභියෝග කිරීම සහ ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටීම සම්බන්ධයෙන් මානව හිමිකම් ආරක්ෂකයින් විසින් ඉටු කරන ලද තීරණාත්මක කාර්යභාරය පිළිගත යුතුය.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂකයින් සැලකිය යුතු අභියෝගවලට මුහුණ දෙයි. සමහර අවස්ථාවලදී, ඔවුන් තම නීත්‍යානුකූල ක්‍රියාකාරකම් සඳහා අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම සහ නඩු පැවරීම පිළිබඳ නිතරම ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමට පැමිණිලි කරයි. ඔවුන් බොහෝ විට ප්‍රචණ්ඩත්වය, තර්ජන, පළිගැනීම්, බිය ගැන්වීම්, තථ්‍ය හෝ නීති විරෝධී වෙනස්කම් කිරීම්, හිරිහැර කිරීම් සහ වෙනත් අත්තනෝමතික ක්‍රියාවන්ට මුහුණ දෙන බවට ද පැමිණිලි කරනු ලබයි. තවද ඔවුන් නිතර මාධ්‍ය තුළින් අපකීර්තියට පත් කරනු ලබයි.

මානව හිමිකම් ආරක්ෂකයින්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් රජයට නිශ්චිත කාර්යභාරයක් ඇත. පළමුව, මානව හිමිකම් ආරක්ෂකයින්ගේ අයිතිවාසිකම්වලට ගරු කිරීම සහ මෙම අයිතීන් උල්ලංඝනය කිරීම හෝ අනවශ්‍ය ලෙස සීමා කිරීමෙන් වැළකී සිටීම එහි යුතුකමකි. දෙවනුව, පුද්ගලික ක්‍රියාකාරීන් විසින් මානව හිමිකම් ආරක්ෂකයන්ගේ අයිතීන් උල්ලංඝණය කිරීම් වලින් ආරක්ෂා කිරීම එහි ධනාත්මක යුතුකමකි. උල්ලංඝනයන් සිදු වන විට, මානව හිමිකම් ආරක්ෂකයින්ට ඵලදායී පිළියම් සැපයීමේ වගකීම ද රජය සතු වේ.

මෙම පුළුල් සන්දර්භය තුළ, ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම් ආරක්ෂකයින්ගේ අයිතිවාසිකම් අර්ථවත් ලෙස ගරු කිරීම සහ ආරක්ෂා කිරීම සහතික කිරීම සඳහා ඇතැම් පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ සැකසීමේ හදිසි අවශ්‍යතාවයක් පවතී.

**1.** ආරක්ෂා කිරීමට ඇති අයිතිය

1.1 මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා මානව හිමිකම් ආරක්ෂකයින් විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්වල නීත්‍යානුකූලභාවය රාජ්‍යය සක්‍රීයව ප්‍රවර්ධනය කළ යුතුය. මානව හිමිකම් ආරක්ෂකයින්ට ඔවුන්ගේ ක්‍රියාකාරකම්වල නිරත වීමට සමාජ, ආර්ථික, දේශපාලනික සහ වෙනත් ක්ෂේත්‍රවල අවශ්‍ය සියලු තත්වයන් නිර්මාණය කළ යුතුය. මේ සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග අතරට මානව හිමිකම් ආරක්‍ෂකයින් ආරක්‍ෂා කිරීමේ අවශ්‍යතාවය සහ ඔවුන්ගේ කාර්යයේ වැදගත්කම ප්‍රසිද්ධියේ පිළිගැනීම, එක් එක් මානව හිමිකම් ආරක්‍ෂකයින් සඳහා පිළිගැනීමක් ලබා දීම, මානව හිමිකම් ගැටලු සම්බන්ධයෙන් මානව හිමිකම් ආරක්‍ෂකයින් සාධනීය ලෙස සම්බන්ධ කර ගැනීම සහ යෝජිත මානව හිමිකම් නීති සහ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මානව හිමිකම් ආරක්‍ෂකයන්ගේ උපදෙස් ලබා ගැනීම ඇතුළත් වේ.

1.2 ස්ත්‍රීන්, ළමයින්, වාර්ගික සහ ආගමික සුළුතරයන්, ආබාධ සහිත පුද්ගලයන්, අභ්‍යන්තරව අවතැන් වූවන්, සංක්‍රමණික සේවකයන් සහ LGBTIQ+ ප්‍රජාව ඇතුළු ආන්තික හා අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලින් හෝ එම කණ්ඩායම් නියෝජනය කරන මානව හිමිකම් ආරක්ෂකයින්ගේ විශේෂ අවශ්‍යතා රජය විසින් සලකා බැලිය යුතු අතර ප්‍රවර්ධනය සඳහා විශේෂ ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. නිදසුනක් වශයෙන්, මානව හිමිකම් ආරක්‍ෂකයින් මුහුණ දෙන ප්‍රචණ්ඩත්වය, තර්ජන, පළිගැනීම්, බිය ගැන්වීම්, තත්‍ය හෝ නීතිමය අහිතකර වෙනස්කම් කිරීම්, හිරිහැර කිරීම් හෝ වෙනත් අත්තනෝමතික ක්‍රියාවන් සහ මානව හිමිකම් ආරක්‍ෂකයන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය ද ඉලක්ක විය හැකිය. එපමනක් නොව, මානව හිමිකම් ආරක්ෂකයින් ඔවුන්ගේ වාර්ගික හෝ ආගමික අනන්‍යතාවය හේතුවෙන් ඉහල අවදානම් වලට මුහුණ දිය හැක.

1.3 රාජ්‍ය බලධාරීන් මානව හිමිකම් ආරක්ෂකයින් හෝ ඔවුන්ගේ පවුල්වලට එරෙහිව ප්‍රචණ්ඩත්වය, තර්ජන, බිය ගැන්වීම්, පළිගැනීම් හෝ තථ්‍ය හෝ නීතිමය අහිතකර වෙනස්කම් කිරීම්වල යෙදීමෙන් වැළකිය යුතුය. එමෙන්ම මානව හිමිකම් ආරක්ෂකයින් හෝ ඔවුන්ගේ පවුල්වලට එරෙහිව අසාධාරණ හෝ අනවශ්‍ය භෞතික හෝ ඩිජිටල් නිරීක්ෂණ, ඔවුන් විසින් භාවිතා කරන පරිශ්‍ර හෝ වාහන සෝදිසි කිරීම හෝ භාවිතා කරන උපකරණ අත්පත් කර ගැනීම ඇතුළු ඕනෑම ආකාරයක අත්තනෝමතික ක්‍රියාවකට හෝ හිරිහැරයකට ඔවුන් හා ඔවුන්ගේ පවුල් යටත් කිරීමෙන් වැළකී සිටිය යුතුය. රාජ්‍ය අධිකාරීන් විසින් මඩ ප්‍රචාරක, නිෂේධාත්මක නිරූපණ, හෝ මානවහිමිකම්ආරක්ෂකයින්ගේනීත්‍යානුකූලක්‍රියාකාරම්අපකීර්තියට පත්කිරීමෙන් වැළකිය යුතුය.

1.4 මානව හිමිකම් ආරක්ෂකයින්ගේ නීත්‍යානුකූල ක්‍රියාකාරම් හේතුවෙන්, ප්‍රචණ්ඩත්වය, තර්ජන, පළිගැනීම්, බිය ගැන්වීම්, තථ්‍ය හෝ නීතිමය අහිතකර වෙනස්කම් කිරීම්, හිරිහැර කිරීම් හෝ වෙනත් ඕනෑම පෞද්ගලික ක්‍රියාකරුවෙකු විසින් සිදු කරන අත්තනෝමතික ක්‍රියාවකට එරෙහිව මානව හිමිකම් ආරක්ෂකයින්ගේ හෝ ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව සහතික කිරීමට රජය අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගත යුතුය. රාජ්‍ය බලධාරීන් පුද්ගලික ක්‍රියාකාරීන්ගේ එවැනි ක්‍රියාවක් ප්‍රසිද්ධියේ හෙළා දැකිය යුතු අතර එවැනි ක්‍රියාකාරීන්ගේ වගවීම සහතික කළ යුතුය.

1.5 මානව හිමිකම් ආරක්‍ෂකයන්ගේ නීත්‍යානුකූල ක්‍රියාකාරකම් සාපරාධීකරණය කරන හෝ අපරාධ කිරීමේ බලපෑමක් ඇති කරන නීති පැනවීමෙන් හෝ ප්‍රතිපත්ති හෝ ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීමෙන් රාජ්‍යය වැළකිය යුතුය. රාජ්‍ය බලධාරීන් විසින් මානව හිමිකම් ආරක්‍ෂකයින් අනවශ්‍ය නෛතික හා පරිපාලනමය ක්‍රියාදාමයන්ට හෝ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට

ගැනීම වලට සහ රඳවා තබා ගැනීමට මෙන්ම ඔවුන්ගේ නීත්‍යානුකූල ක්‍රියාකාරකම් සඳහා වෙනත් සම්බාධක ඇතුළු නීතිමය අධිකාරිය අනිසි ලෙස භාවිතා කිරීම සිදු නොකල යුතුය. මානව හිමිකම් ආරක්‍ෂකයන්ට එරෙහිව අපරාධ නඩු පවරන විට, ස්වයං චෝදනා නොකිරීමට ඇති අයිතිය, නීති උපදෙස් වෙත ප්‍රවේශ වීමේ අයිතිය සහ සාධාරණ නඩු විභාගයක් සඳහා ඇති අයිතියේ සියලුම කොටස් රජය විසින් සහතික කළ යුතුය. ස්වාධීන අධිකරණයක් මගින් පූර්ණ සහ සාධාරණ නඩු විභාගයක් පැවැත්වීම සඳහා අවස්ථා ද චෝදනා එල්ල වී සිටින මානව හිමිකම් ආරක්ෂකයින්ට ලැබිය යුතුය.

1.6 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වැනි වගන්තිය මගින් සීමා කිරීමට අවසර දී ඇති අවස්ථා හැර ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති අයිතිවාසිකම් සඳහා මානව හිමිකම් ආරක්‍ෂකයන්ට සීමා පැනවීමෙන් රජය වැළකිය යුතුය. එවැනි සීමා කිරීමක් පාර්ලිමේන්තු පනතක් මගින් හෝ 1947 අංක 25 දරන මහජන ආරක්ෂක ආඥාපනත යටතේ ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද හදිසි රෙගුලාසියක් මගින් විය යුතුය. වෙනත් කිසිදු රෙගුලාසියක් හෝ පරිපාලන චක්‍රලේඛයක් හරහා සීමා පැනවිය නොහැක. මානව හිමිකම් ආරක්‍ෂකයන්ගේ අයිතිවාසිකම්වලට සීමාවක් පැනවීමේදී, රාජ්‍යය විසින් සීමා කිරීමේ අවශ්‍යතාව පෙන්නුම් කළ යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වැනි වගන්තියේ දක්වා ඇති නීත්‍යානුකූල අරමුණු ඉටුකර ගැනීමට සමානුපාතික වන ක්‍රියාමාර්ග පමණක් ගත යුතුය.

1.7 මානව හිමිකම් ආරක්ෂකයින්ගේ ක්‍රියාකාරකම් නියාමනය කිරීම සඳහා නිර්මාණය කර ඇති ඕනෑම නව නීති, ප්‍රතිපත්ති හෝ ක්‍රියා පටිපාටි පිළිබඳව රාජ්‍යය අර්ථවත් ලෙස මානව හිමිකම් ආරක්ෂකයන්ගෙන් උපදෙස් ලබා ගත යුතුය.

**2.** නිදහස සහ ආරක්ෂාව සඳහා ඇති අයිතිය

2.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **11** සහ **13(1)** ව්‍යවස්ථා මගින් සහතික කර ඇති පරිදි මානව හිමිකම් ආරක්‍ෂකයන්ගේ නිදහස සහ ආරක්‍ෂාව සඳහා ඇති අයිතියට රාජ්‍යය ගරු කළ යුතුය.

2.2 මානව හිමිකම් ආරක්‍ෂකයින්ට ඔවුන්ගේ නීත්‍යානුකූල ක්‍රියාකාරකම් හේතුවෙන් නීති විරෝධී ඝාතනය, වධහිංසා පැමිණවීම හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම සහ අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබාගැනීම් වලින් නිදහස් වීමට අයිතිය ඇත.

**3.** සමානාත්මතාවයට සහ වෙනස් කොට සැලකීමට ඇති අයිතිය

3.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **12(1)** අනු ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති පරිදි සමානාත්මතාවය සහ නීතියේ සමාන ආරක්ෂාව සඳහා මානව හිමිකම් ආරක්‍ෂකයන්ට ඇති අයිතියට රාජ්‍යය ගරු කළ යුතුය.

3.2 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2), අනු ව්‍යවස්ථාවෙන් පැහැදිලිව හෝ ව්‍යංගයෙන් සහතික කර ඇති පරිදි රාජ්‍යය විසින් මානව හිමිකම් ආරක්ෂකයින්ගේ ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, ලිංගික දිශානතිය, දේශපාලන මතය, උපන් ස්ථානය, ආදිය මත වෙනස් කොට සැලකීම නොකළ යුතුය.

**4.** අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ තොරතුරු දැනගැනීමේ අයිතිය

4.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ) වැනි වගන්තිය මගින් සහතික කර ඇති පරිදි ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් තනි තනිව සහ වෙනත් අය සමඟ එක්ව මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සඳහා මානව හිමිකම් ආරක්‍ෂකයන්ට ඇති අයිතියට රාජ්‍යය ගරු කර ආරක්ෂා කළ යුතුය. එවැනි අයිතියක් සමාජ මාධ්‍ය වේදිකා ඇතුළු ඕනෑම මාධ්‍යයක් හරහා ක්‍රියාත්මක කළ හැක.

4.2 එවැනි අයිතියට ඇතුළත් වන්නේ:

(අ) නීතියෙන් සහ ප්‍රායෝගිකව සියලු මානව හිමිකම් පිළිපැදීම පිළිබඳව අධ්‍යයනය කිරීමට, සාකච්ඡා කිරීමට, සැකසීමට සහ අදහස් දැරීමට සහ නව මානව හිමිකම් අදහස් සහ මූලධර්ම වර්ධනය කිරීමට සහ සාකච්ඡා කිරීමට ඇති නිදහස;

(ආ) සියලු මානව හිමිකම් පිළිබඳ අදහස්, තොරතුරු සහ දැනුම නිදහසේ ප්‍රකාශයට පත් කිරීමට, බෙදා හැරීමට සහ නව මානව හිමිකම් අදහස් සහ මූලධර්ම පිළිගැනීමට පෙනී සිටීමට ඇති නිදහස; සහ

(ඇ) එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය මත පදනම් වූ සහ ගිවිසුම් මත පදනම් වූ මානව හිමිකම් යාන්ත්‍රණ ඇතුළුව රාජ්‍ය නොවන හෝ අන්තර් රාජ්‍ය ආයතන, සංවිධාන සහ යාන්ත්‍රණ සමඟ සන්නිවේදනය කිරීමේ නිදහස.

4.3 එවැනි මාධ්‍ය භාවිතා කරන මානව හිමිකම් ආරක්ෂකයන්ගේ නීත්‍යානුකූල ක්‍රියාකාරකම්වලට බාධා වන පරිදි මුද්‍රිත, විද්‍යුත් හෝ සමාජ මාධ්‍ය වාරණය කිරීමෙන් හෝ අසාධාරණ ලෙස හෝ අනවශ්‍ය ලෙස නියාමනය කිරීමෙන් රජය වැළකී සිටිය යුතුය.

4.4 ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් තනි තනිව සහ වෙනත් අය සමඟ එක්ව සියලු මානව හිමිකම් පිළිබඳ තොරතුරු සෙවීමට, ලබාගැනීමට, ලැබීමට සහ තබා ගැනීමට, තොරතුරු සඳහා ප්‍රවේශය තිබීම හා, එම අයිතිවාසිකම් දේශීය නීතිය, අධිකරණ හෝ පරිපාලන පද්ධති තුළ ක්‍රියාත්මක වීමද ඇතුළුව, මානව හිමිකම් ආරක්ෂකයන්ගේ අයිතියට රාජ්‍යය ගරු කළ යුතු අතර ආරක්ෂා කළ යුතු වේ.

**5.** සාමකාමී රැස්වීමට ඇති අයිතිය

5.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (ආ) වැනි ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති පරිදි, දේශීය හා ජාත්‍යන්තර මට්ටමින් මානව හිමිකම් ආරක්ෂකයන්ට තනි තනිව සහ රාජ්‍ය නොවන සංවිධාන, වෙනත් කණ්ඩායම් සමඟ එක්ව හෝ පාර්ශවකරුවන් ලෙස මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමේ අරමුණින් සාමකාමීව හමුවීමට හෝ එක්රැස් වීමට ඇති අයිතියට රාජ්‍යය ගරු කිරීම සහ ආරක්ෂා කිරීම කළ යුතුය.

5.2 සාමකාමීව රැස්වීමට ඇති එවැනි අයිතියට ඵලදායී ලෙස ආරක්ෂා වීමට ඇති අයිතිය හා ජාතික නීතිය යටතේ විරෝධතා දැක්වීමේදී, එරෙහිව ප්‍රතිචාර දැක්වීමේදී, පැහැර හැරීම්, රාජ්‍යයට ආරෝපණය කළ හැකි මානව හිමිකම් උල්ලංඝනය කිරීම හා පුද්ගලික ක්‍රියාකාරීන් විසින් සිදු කරන ලද මානව හිමිකම් කඩකිරීම් ඇතුළත් වේ.

**6.** සමාගමයේ නිදහස

6.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ඇ) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති පරිදි දේශීය හා ජාත්‍යන්තර මට්ටමින්, තනි තනිව සහ වෙනත් අය සමඟ එක්ව, මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමේ අරමුණින් රාජ්‍ය නොවන සංවිධාන, සංගම් හෝ කණ්ඩායම් පිහිටුවීමට, සම්බන්ධ වීමට, මානව හිමිකම් ආරක්ෂකයන්ට ඇති අයිතියට රාජ්‍යය ගරු කිරීම සහ ආරක්ෂා කිරීම කළ යුතු වේ.

6.2 සාමකාමී ක්‍රම මගින් මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ ප්‍රකාශිත අරමුණ සඳහා සම්පත් ඉල්ලීමට, ලබා ගැනීමට සහ භාවිතා කිරීමට ඇති නිදහස, සමාගමයේ නිදහස යන අයිතියට ඇතුළත් වේ.

6.3 මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන, සංගම් හෝ කණ්ඩායම් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම සහ මූල්‍ය කළමනාකරණයේදී මානව හිමිකම් ආරක්ෂකයන්ට අනවශ්‍ය පරිපාලන හෝ නියාමන බරක් පටවන නීති පැනවීම හෝ ප්‍රතිපත්ති හෝ ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීමෙන් රාජ්‍ය වැළකිය යුතුය.

**7.** සංචරණය සඳහා ඇති අයිතිය

7.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)( ඌ) වැනි වගන්තිය මගින් සහතික කර ඇති පරිදි, මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමේ අරමුණින්, ජාතික හා ජාත්‍යන්තර මට්ටමින්, මානව හිමිකම් ආරක්ෂකයන්ගේ තනි තනිව සහ වෙනත් අය සමඟ ඇසුරු කරමින්, මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ අරමුණින් සංචරණය සඳහා ඇති නිදහසට රාජ්‍යය ගරු කර ආරක්ෂා කළ යුතුය.

7.2 එවැනි අයිතියට ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රදේශය පුරාම නිදහසේ සංචරණය කිරීමට සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ අරමුණින් විදේශගත වීමේ හැකියාව ඇතුළත් වේ.

7.3 තොරතුරු රැස් කිරීම, මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ලේඛනගත කිරීම, මානව හිමිකම්වලට ගොදුරු වූවන්ට උපකාර කිරීම සඳහා මානව හිමිකම් ආරක්ෂකයන්ට ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයකට ඇතුළු වීමට හෝ ශ්‍රී ලංකාවෙන් පිටවීමට පූර්ව අවසරය ලබා ගැනීමේ අවශ්‍යතාවයක් පැනවීමෙන් රාජ්‍ය බලධාරීන් වැළකී සිටිය යුතුය.

**8.** එලදායී සහනයන් සඳහා ඇති අයිතිය

8.1 රාජ්‍යය විසින් මානව හිමිකම් ආරක්ෂකයන්ගේ අයිතිවාසිකම්වලට ගරු කිරීම සහ ආරක්ෂා කිරීම, තනි තනිව සහ වෙනත් අය සමඟ එක්ව, ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන විට එලදායී සහනයන් මගින් ප්‍රතිලාභ දිය යුතුය. රාජ්‍යය ඒ අනුව මානව හිමිකම් ආරක්ෂකයන්ගේ අයිතීන් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් දණ්ඩමුක්තියේ සංස්කෘතියක් නොමැති බවටත්, එම අයිතිවාසිකම් කඩ කරන්නන් සුදුසු නීතිමය ප්‍රතිවිපාකවලට මුහුණ දෙන බවටත් සහතික විය යුතුය

8.2 නීතිය බලාත්මක කිරීමේ බලධාරීන්ට පැමිණිලි කිරීමට පුද්ගලිකව හෝ නීත්‍යානුකූලව බලයලත් නියෝජනයක් හරහා අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇතැයි කියනු ලබන සියලුම මානව හිමිකම් ආරක්ෂකයන්ට එහි අවස්ථාවන් රජය සහතික කළ යුතු අතර, බලධාරීන් එවැනි පැමිණිල්ලක් වාර්තා කිරීම හෝ සැකසීම ප්‍රතික්ෂේප නොකළ යුතුය. එවැනි සෑම පැමිණිල්ලක්ම නීතියෙන් ස්ථාපිත ස්වාධීන, අපක්ෂපාතී සහ නිසි අධිකරණ හෝ වෙනත් අධිකාරියක් ඉදිරියේ මහජන විභාගයකදී කඩිනමින් සමාලෝචනය කළ යුතු අතර, එම අධිකාරියෙන් නීතියට අනුකූලව, යම් වන්දියක් ඇතුළුව සහන සැලසීමේ තීරණයක් ලබා ගත යුතුය. මානව හිමිකම් ආරක්ෂකයන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුවූ විට, අවසාන තීරණය බලාත්මක කිරීම සහ ප්‍රදානය කිරීම, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව සිදු විය යුතුය.

8.3 කිසියම් පුද්ගලික ක්‍රියාකරුවෙකු විසින් සිදු කරනු ලබන කිසියම් ප්‍රචණ්ඩත්වය, තර්ජන, පළිගැනීම්, බිය ගැන්වීම්, තථ්‍ය හෝ නීතිමය අහිතකර වෙනස්කම් කිරීම්, හිරිහැර කිරීම් හෝ වෙනත් අත්තනෝමතික ක්‍රියාවක් ගැන පැමිණිලි කරන මානව හිමිකම් ආරක්ෂකයන්ට හා ඔවුන්ගේ පවුල් සඳහා රජය එලදායී සහ ප්‍රමාණවත් ආරක්ෂාවක් සැපයිය යුතුය.

8.4 රාජ්‍යය විසින් සියලුම මානව හිමිකම් ආරක්ෂකයන්ට තනි තනිව සහ අනෙකුත් අය සමඟ එක්ව පහත සඳහන් දේ කිරීමට ඇති අයිතිය සහතික කළ යුතුය;

(අ) මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් තනි නිලධාරීන්ගේ සහ රාජ්‍ය ආයතනවල ප්‍රතිපත්ති සහ ක්‍රියා පිළිබඳව පෙත්සම් හෝ වෙනත් සුදුසු ක්‍රම මගින් නිසි අධිකරණ, පරිපාලන හෝ ව්‍යවස්ථාදායක බලධාරීන්ට පැමිණිලි කිරීම;

(ආ) ජාතික නීතියට සහ අදාළ ජාත්‍යන්තර බැඳීම් සහ බැඳීම්වලට අනුකූල වීම පිළිබඳ මතයන් සැකසීම සඳහා මහජන සාක්ෂි විමසීම්, ක්‍රියාදාමයන් සහ නඩු විභාගවලට සහභාගී වීම;

(ඇ) මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් නීති ආධාර හෝ වෙනත් අදාළ උපදෙස් සහ සහාය ලබා දීම.

8.5 මානව හිමිකම් පිළිබඳ කරුණු සම්බන්ධයෙන් සන්නිවේදනයන් ලබා ගැනීමට සහ සලකා බැලීමට සාමාන්‍ය හෝ විශේෂ නිපුණතා ඇති ජාත්‍යන්තර ආයතනවලට ප්‍රවේශ වීමට සහ සන්නිවේදනය කිරීමට මානව හිමිකම් ආරක්ෂකයන් තනි තනිව සහ වෙනත් අය සමඟ සම්බන්ධ වී ඇති අයිතියට රාජ්‍යය ගරු කර ආරක්ෂා කළ යුතුය.

**නිර්දේශ**

ඉහත මාර්ගෝපදේශ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා රජය දිරිමත් කරනු ලැබේ:

1. **මානව හිමිකම් ආරක්ෂකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන සියලුම ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම සහ ඇගයීමට ලක් කිරීම සහතික කිරීම සඳහා රජය තුළ අවධානය යොමු කිරීමේ කේන්ද්‍රීය ස්ථානයක් / පුද්ගලයකු ස්ථාපිත කිරීම සහ එවැනි කාර්යන් පැවරී ඇති විවිධ රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය සහතික කිරීම.**

2. **අවදානමට ලක්ව ඇති මානව හිමිකම් ආරක්ෂකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අදාළ විශේෂඥයින් සමඟ සාකච්ඡා කර සුදුසු ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී ආරක්ෂණ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ යාන්ත්‍රණ සංවර්ධනය කිරීම. 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ භෞතික ආරක්ෂාව, තාවකාලික නැවත ස්ථානගත කිරීම සහ වෙනත් ආරක්ෂණ පියවරයන් සහ උපකාරක සේවා සැපයීම, අදාළ අවස්ථාවලදී මෙයට ඇතුළත් විය යුතුය.**

3. **මානව හිමිකම් ආරක්ෂකයන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්, ආරක්ෂක අංශ, අනෙකුත් බලධාරින් සහ නියාමකයින් ඇතුළු රාජ්‍ය අධිකාරීන් සඳහා පරිපූර්ණ පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් අදාළ විශේෂඥයින් සමඟ සාකච්ඡා කර සංවර්ධනය කිරීම. වැඩසටහන සඳහා ප්‍රායෝගික නිදර්ශන සහිත පුහුණු අත්පොතක් ද ඇතුළත් විය යුතු අතර එම පුහුණුව දැනට නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් හා ආරක්ෂක අංශ සඳහා පවතින විෂය මාලාවන් සමග සම්බන්ධ විය යුතුය.**

4. **සියලුම නීති සහ ප්‍රතිපත්ති, අදාළ විශේෂඥයන් සමඟ සාකච්ඡා කර සමාලෝචනය කිරීම සහ 1865 අංක 16 දරන පොලිස් ආඥාපනත, 1883 අංක 2 දරන දණ්ඩ නීති සංග්‍රහ ආඥාපනත, 1897 අංක 3 දරන නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනත, 1947 අංක 25 දරන මහජන ආරක්ෂක ආඥාපනත, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත, සහ 2007 අංක 56 දරන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය,පනත මානව හිමිකම් ආරක්ෂකයන්ගේ නීත්‍යානුකූල ක්‍රියාකාරකම්වලට බාධා කිරීම සඳහා වැරදි ලෙස යොදවා ඇත. අපැහැදිලි නිර්වචන සහිත නීතිමය ප්‍රතිපාදන පුළුල් අර්ථනිරූපන ලබාදීම හේතුවෙන් මානව හිමිකම් ආරක්ෂකයින් ගේ නීත්‍යානුකූල ක්‍රියාකාරකම්**

සඳහා නඩු පැවරීමේදී එම නීතී අවභාවිත කිරීමෙන් සිදුවිය හැකි බැවින් එකී නීතින් සංශෝධනය කිරීමහෝ ඉවත් කිරීමට සිදුවිය යුතුය.

**5.** රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ අරමුණින් සහ පරිපාලන හා මූල්‍ය කටයුතු සඳහා භාවිතා කරන **1980** අංක **31** දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණ) පනත ඇතුළුව දැනට පවතින සියලුම නීති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි අදාළ විශේෂඥයන් සමඟ සාකච්ඡා කර සමාලෝචනය කිරීම හා රාජ්‍ය නොවන සංවිධාන නියාමනය කිරීම, ලියාපදිංචිය වෛකල්පිත බවත්, පැහැදිලි, සරල සහ වෙනස් කොට සැලකීමකින් තොරව ලබා ගත හැකි බවත් සහතික කළ යුතුය. පරිපාලන සහ මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා සාධාරණ සහ පැහැදිලිව නීතියෙන් සපයා ඇති බවත්, රාජ්‍ය නොවන සංවිධාන කාර්යාල සහ මූල්‍ය වාර්තා පිළිබඳ ඕනෑම පරීක්ෂණයක් පැහැදිලි නෛතික පදනමකින් සහ සාධාරණ සහ විනිවිදභාවයකින් පමණක් සිදු කරන බවට සහතික විය යුතුය.

6. අවදානමට ලක්ව සිටින මානව හිමිකම් ආරක්ෂකයන්ගේ ආරක්ෂාවට, හදිසි සහන සැලසීමට සහ වෙනත් ආධාරක සේවා සඳහා අයවැයෙන් නිත්‍ය ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීම.